# චමට චෙට්ටු දමන තරමට තෙරපුම වැඩි වෙලා.

හයිඩ්පාක් පිටියේ වේදිකාවෙන් බැහැල එනකොට මාව වට කරගත්තු මාධ්‍යවේදීන් ඇහැව්වෙ ඇයි මං කථාවක් කළෙ නැත්තේ කියල.

මං පෙන්වල දුන්න අපි එකසත්කම් ඇති කරගන්නේ වෘත්තීය සමිති මට්ටෙමෙන් නිසා මං කථා කළොත් දේශපාලන පක්ෂයක ආධිපත්‍යය උඩින් ඇති කරන්න යනවා කියන කළකිරීම ඇති වෙන්න පුළුවන්. අපිට අවශ්‍ය වුණේ වැඩිම සටන්කාමී පිරිසක් ආණ්ඩුවේ ආර්ථික හා යුධ ප්‍රතිපත්තියට එරෙහිව වීදි බැස්සවීම මිස දේශපාලන පක්ෂයකට ප්‍රචාරය ලබාගැනීම නොවන බව.

ඇත්තෙන්ම අපේ පැතුම සාර්ථක වුණා. දියුණු සේවක ජනතාවක් විවිධ අංශවලින් ඇවිත් ආණ්ඩුවේ උද්ධමණකාරී, ගෝලීය ධනවාදී ආර්ථික ප්‍රතිපත්තියට පමණක් නොව මිනීමරු යුදවාදයටත් දැඩි ලෙස විරුද්ධත්වය පාමින් වීදි බැස සෝෂා කළා. හඬ නැගුවා.

මුළු කොළඹම පෙළපාලිවලින් හිස් වෙන කොට අපේ පෙළපාලියට පන්දහසකට (5000) ආසන්න පිරිසක් එකතු වීම අපට ලොකු ජයග්‍රහනයක්.

ඒ අය වැඩපලවල නායක මට්ටමේ උදවිය. ඒ නිසා හුඟ දෙනෙක් විවිධ සේවක පිරිස් සිය ගණනක් නියෝජනය කළා. ඒ නිසා එය ප්‍රබල විරෝධයක්.

දෙමළ, සිංහල හෝ ආගම් භේදයක් නැතිව වේදිකාවේ සෑම කොටසක්ම ඉබේම නියෝජනය වුණා. එකම අඩුව බාලා හෝ ෂා දෙමළෙන් වචන ටිකක් හෝ කථා කරන්නට බැරි වීම.

මටත් ඒක මතක් කරන්න අමතක වුණා. එතැන දෙමළ කථා කරන ජනතා නියෝජනයකුත් තිබුණ නිසා එතැන ලොකු අඩුපාඩුවක් වුණා.

ඒත් කථා කරපු හතර දෙනාම එක වගේ යුද්ධයේ බලපෑම ගැන ඉතා තදින් අවධාරණය කරන අතරම දෙමළ ජනතාවගේ පාලන අයිතිය ගැනත් ඉතාම තදින්ම මතු කළා.

ලීනස් හා ධර්මසිරි වාමාංශික පෙරමුණේ නායකයින් නිසා ඒක අපි බලාපොරොත්තු වුණ දෙයක් වුණත් බාලාත්, MR ෂාත් ඉතාම නිවැරදිව යුද්ධය හා එයින් වැඩ කරන ජනතාවට පොදුවේ විනාශය ඉතාම හොඳින් පැහැදිලි කළා.

පහුගිය කාලේ යුද්ධයට විරුද්ධව රාජ්‍ය නොවන සංවිධානවලින් පෙළපාලි සංවිධානය කළා. දහස් ගණන් සෙනඟ ගෙනාවා. ඒත් ඒ ආපු අයගෙන් යුද්ධයට දැනුවත්ව විරෝධය දක්වූයේ චමේ බලපෑම තිබුණ සිය ගණනක් පමණයි. හුඟ දෙනෙක් ආවේ තමන්ට ලැබෙන පහසුකම් හා ගෙවීමක් බලාපොරොත්තුවෙන්. ඒ නිසා ඒවා ශක්තිමත් යුධ විරෝධයක් ලෙසට අවධාරණය කරන්න අමාරුයි.

ඒත් මේ ආපු දහස් ගණන් සෙනඟ ඇත්තටම වැඩපල මට්ටමේ සටන්වලින් ගොඩනැඟුන නායකයින්. ඒ අය දේශපාලන සාකච්ඡාවක නිරත වෙලා ඉන්න අයයි. බැංකු සේවකයින් මැද පංතික වුණත් දේශපාලනික වශයෙන් අවදි වුණ කොටසක්. මොකද? ඒ අයගේ සමිති නායකයන් ලොකු විවාදයන් තුළින් ප්‍රජාතන්ත්‍රවාදීව තෝරා ගැනීමට පියවර ගත් නිසා.

ඒසේ මේ පෙළපාලිය පැවැත්වූයේ මහින්ද රජයේ ප්‍රතිපත්තිවලට ලොකු අර්බුදයක් ඇති වුණ මොහොතක. ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණත් දෙකඩ වෙලා ඉන්න වේලාවකයි මේ මැයි ප්‍රහාරය එල්ල වුණේ.

මෙය නිකම්ම නායකයින්ගෙන් ඇති වුණ දෙයක් නෙවෙයි. එයට සමාජ බලපෑමක් තිබුණා. ආණ්ඩුවේ යුද ප්‍රතිපත්ති මෙන්ම ගෝලීය ධනවාදී ආර්ථික ප්‍රතිපත්තිත් අර්බුදයට පත් වෙලා තියෙන්නේ.

දැන් වැඩ කරන ජනතාව ටිකෙන් ටික සටනට ඇතුළ් වෙන්න පටන් අරන්. ඒ වැඩ කරන ජනතාවගේ ගමන ඉහළ නායකත්වයන් සොලවා ගෙන එන්නට පටන් අරන්.

ඒ නිසාම බාලා වගේ සමිති නායකයින්ට ඒ සටන්කාමී නිසහ අරගලය අනුව හඬ නගන්නට සිද්ධ වෙලා තියෙනව. වැඩ කරන ජනතාවට සැබෑ සම්බන්ධකමක් තිබෙන නායකයින්ට අනිවාර්යයෙන්ම සිද්ධ වෙනව සටන් මහට අවතීර්ණ වෙන්න.

එනිසා, මේ පෙළපාලිය හා රැළිය පහළ සටන්කාමීන්ගේ මැදිහත්වීමක් ඇතිවයි දියත් වුණේ කියල කියන්නට පුළුවන්.

මේ මැයි දිනයේදී අපට පෙනුන අළුත් තත්වය තමා ජනතා විමුක්ති පෙරමුණත් ජාතිවාදය වෙනුවට මහ වැඩවර්ජන ගැන වඩා අවධාරණය කිරීම. ආණ්ඩුවට විරුද්ධ දකුණේ අරගලයන් ගැන වඩා විවෘතව කථා කරන තැනකට එන්න උත්නැහේලටත් සිද්ධ වුනා.

අනෙක් අතට අවස්ථාවාදී පැරණි වාමාංශික පැරණි පක්ෂවලටත් වෙනම මැයි දිනයක් දියත් කරන්න සිද්ධ වුණා. වෙනදා වගේ මහින්දගේ පෙළපාලියට, රැළියට එකතු වෙනවා වෙනුවට විරුද්ධ වචන කථා කරන තැනට උන්නැහේලා පත්වෙලා.

මෙයින් පෙනෙන්නේ අවස්ථාවාදී වමේ නායකයින්ටත් වාම වෙට්ටු දමන තරමට පංති තෙරපුම වැඩි වෙලා. මේ අනුව ළඟදීම හර්තාල් ඇති වෙන්න පුළුවන් බවයි අපට කියන්න වෙන්නේ□